ද මැසිනොද් විදුහල කඳාන

**De Mazenod College - Kandana**

27 . 03 . 2018

# භූගෝල විද්‍යාව -I

පැය 2

13 ශ්‍රේණිය

දෙවන වාර පරීක්ෂණය 2018 මාර්තු

උපදෙස් :

★ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

★ I කොටසට බහුවරණ ප්‍රශ්න 30 ක් ඇතුළත් වේ. I කොටසට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලිවිය යුතු වේ.

සැලකිය යුතුයි : පැන්සලෙන් ලියන පිළිතුරුවලට ලකුණු දෙනු නොලැබේ.

★ I සහ II කොටස්වලට සපයන ලද පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදිය යුතු වේ.

De Mazenod College Kandana Learning Resource Centre

## I කොටස

A, B, C, D සහ E යන රූපසටහන්වලින් දැක්වෙන භූ රූපවල නිවැරදි අනුපිළිවෙළ වන්නේ,




A B C D E

(1) කපොල්ල, විච්ඡින්න සානුව, කොත් කන්ද, ආයතගාමී කඳුවැටි, තීර්යක් නිම්නය

(2) මොහොර, කොත් කන්ද, සානුව, තීර්යක් නිම්නය, කපොල්ල

(3) මොහොර, සානුව, කොත් කන්ද, ආයතගාමී කඳුවැටි, කපොල්ල

(4) සමමිතික නිම්නය, කොත් කන්ද, පාෂාණ උද්ගතය, ආයතගාමී කඳුවැටි, මොහොර

(5) උත්තල බෑවුම, හුදකලා කන්ද, කොත් කන්ද, ආයතගාමී කඳුවැටි, ගිරිදුර්ගය (.............)

ශ්‍රී ලංකාවේ 1 : 50 000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන භූ රූප ලක්ෂණ දෙකක් හා ජලවහන ලක්ෂණ දෙකක් ඇතුළත් වරණය වනුයේ,

(1) V හැඩයේ නිම්නය, විච්ඡින්න සානුව, ගංඟඟරය, උත්තල බෑවුම

(2) දියබෙත්ම, විච්ඡින්න සානුව, උත්තල බෑවුම, දූපත

(3) දෙමෝදර, නෙත්තිනෙරු, ගිරිදුර්ගය, දියබෙත්ම

(4) ගංඟඟරය, දුනුවිල, දෙමෝදර, ගල්වන

(5) දුනුවිල, නෙත්තිනෙරු, දියබෙත්ම, හැඩපළු ගංඟාව (.............)

2008 වර්ෂයේ දී කිසියම් රටවල් දෙකක් සඳහා වූ ජන සංඛ්‍යා පිරමීඩ දෙකක් මෙහි (අ) හා (ආ) මගින් දැක්වේ. ඒවා අදාළ වන රටවල් දෙක පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,



(අ) (ආ)

(1) (අ) ඉන්දියාව (ආ) සවුදි අරාබිය

(2) (අ) එක්සත් රාජධානිය (ආ) කෙන්යාව

(3) (අ) ඇමෙරිකා එක්සත් ජනපදය (ආ) ඔස්ට්‍රේලියාව

(4) (අ) [illegible] (ආ) තුර්කිය

4. පහත සඳහන් වරණ අතුරින් ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ මූලාශ්‍ර තුනක් දැක්වෙන පිළිතුර වනුයේ,
   (1) චන්ද්‍රිකා ප්‍රතිබිම්බ, ප්‍රශ්නාවලී, භූ ලක්ෂණ සිතියම්
   (2) පුස්තකාල මූලාශ්‍ර, අන්තර්ජාලය, සාකච්ඡා
   (3) ප්‍රශ්නාවලී, සාකච්ඡා, නිරීක්ෂණ
   (4) නිරීක්ෂණ, චන්ද්‍රිකා ප්‍රතිබිම්බ, බැංකු වාර්තා
   (5) සමීක්ෂණ, ගුවන් ඡායාරූප, පුස්තකාල මූලාශ්‍ර

(.............)

5. කේන්ද්‍රීය ප්‍රවණතා දැක්වෙන ප්‍රධාන මිනුමක් වන මාතය යනු,
   (1) දත්ත සමූහයක එකතුව මුළු දත්ත ගණනින් බෙදූ විට ලැබෙන අගයයි.
   (2) දත්ත ව්‍යාප්තියක වැඩිම සංඛ්‍යාතයක් පෙන්වන අගයයි.
   (3) දත්ත වැලක ඉහළ චතුර්තකය හා පහළ චතුර්තකය අතර මධ්‍ය ලක්ෂ්‍යයි.
   (4) දත්ත වැලක ඉහළම අගය දක්වන සංඛ්‍යාවයි.
   (5) දත්ත ව්‍යාප්තියක උපරිම හා අවම අගයයන් අතර වෙනසයි.

(.............)

6. ජාලරේඛය හා සංඛ්‍යාත බහුඅස්‍රය දැක්වෙන්නේ පහත සඳහන් කුමන රූප සටහනක ද?




(.............)

7. දත්ත ව්‍යාප්තියක අපකිරණය දක්වන මිනුම් තුනක් සඳහන් වන්නේ කුමන වරණයේ ද?
   (1) සහසම්බන්ධතා සංගුණකය, ප්‍රතිපායනය, මාතය
   (2) මධ්‍යන්‍යය, සම්මත අපගමනය, මධ්‍යන්‍ය අපගමනය
   (3) පරාසය, අන්තර් චතුර්ථක පරාසය, සම්මත අපගමනය
   (4) ප්‍රතිපායනය, චතුර්ථක අපගමනය, මධ්‍යස්ථය
   (5) සම්මත අපගමනය, මාතය, ප්‍රතිපායනය

(.............)

8. භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය භාවිතයෙන් අඳින ලද අවසන් සිතියමක මූලික අංග වනුයේ,
   (1) පරිමාණය, බණ්ඩාංක, ප්‍රක්ෂේපණය, මාතෘකාව, රාමුව
   (2) රාමුව, මාතෘකාව, දිශාගත කිරීම, පරිමාණය, සූචකය
   (3) තේමාව, ප්‍රක්ෂේපණය, පිහිටීම, බණ්ඩාංක, රාමුව
   (4) දිශාගත කිරීම, රාමුව, තේමාව, පිහිටීම, ප්‍රක්ෂේපණය
   (5) රාමුව, තේමාව, බණ්ඩාංක, පිහිටීම, පරිමාණය

(.............)

9. දුරස්ථ සංවේදන (Remote Sensing) තාක්ෂණයෙන් ලබා ගන්නා තොරතුරු ඉදිරිපත් කරන ප්‍රධාන මාධ්‍ය තුනක් වන්නේ,
   (1) තේමාගත සිතියම් (thematic), භූ ලක්ෂණ සිතියම්, අංකිත (digital) සිතියම්
   (2) සිරස් ඡායාරූප, තිරස් ඡායාරූප, චන්ද්‍රිකා ප්‍රතිබිම්බ (satellite images)
   (3) ත්‍රිමාණ දර්ශන සිතියම්, තේමාගත සිතියම්, දෛශික (analogue) සිතියම්
   (4) ගුවන් ඡායාරූප, චන්ද්‍රිකා ප්‍රතිබිම්බ, ගෝලීය ස්ථානගත කිරීම් පද්ධති (GPS) මගින් ලබාගන්නා සිතියම්
   (5) අංකිත සිතියම්, ගෝලීය ස්ථානගත කිරීම් පද්ධති මගින් ලබාගන්නා සිතියම්, තිරස් ඡායාරූප

(.............)

10. භූගෝලීය තොරතුරු පද්ධති භාවිතයෙන් කළ හැකි ප්‍රධානතම කාර්ය තුන පිළිවෙලින් නිවැරදිව සඳහන් වන්නේ කුමන වරණයෙහි ද?
   (1) තොරතුරු රැස් කිරීම, සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම.
   (2) භූ - අවකාශීය තොරතුරු ගබඩා කිරීම, දෘශ්‍යමානව දැක්වීම හා විශ්ලේෂණය කිරීම ය.
   (3) භූ - අවකාශීය දත්ත ලබා ගැනීම, හැසිරවීම හා සකස් කිරීම ය.
   (4) තොරතුරු එක්රැස් කිරීම, හැසිරවීම හා ඉදිරිපත් කිරීම ය.
   (5) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශනයක් වශයෙන් ඉදිරිපත් කිරීම ය.

(.............)

27 · 03 · 2018

11. භූ පද්ධතියේ උපපද්ධති වනුයේ,
    (1) පාෂාණ ගෝලය, ජල ගෝලය, අපරිවර්තී ගෝලය, ජෛව ගෝලය
    (2) පාෂාණ ගෝලය, ජල ගෝලය, වායු ගෝලය, පරිවර්ති ගෝලය
    (3) පාෂාණ ගෝලය, ජෛව ගෝලය, වායු ගෝලය, ජල ගෝලය
    (4) පාෂාණ ගෝලය, ජල ගෝලය, වායු ගෝලය, අජට ගෝලය
    (5) පාෂාණ ගෝලය, අයන ගෝලය, අපරිවර්තී ගෝලය, ජෛව ගෝලය (..............)

12. පහත සඳහන් කවර පාෂාණ යුගලය අවසාදිත පාෂාණ වර්ගයට අයත් වන්නේ ද?
    (1) කොන්ග්ලමරේට් හා ඩොලරයිට් (2) බැසෝල්ට් හා ඩොලමයිට්
    (3) ක්ලින්ට් හා වටපිඩු පාෂාණ (4) ග්‍රැනයිට් හා බැසෝල්ට්
    (5) ශල්ක හා ජිප්සම් (..............)

13. A, B, C සහ D වශයෙන් ලකුණු කරන ලද යමහල් විදාරණ හතරක රූප පහත දක්වා ඇත. ඒවා නිවැරදිව සඳහන් වන්නේ කවර පිළිතුරෙහි ද?




| | | | | |
|---|---|---|---|---|
| (1) | (A) හවායියන් | (B) ස්ට්‍රොම්බෝලියන් | (C) විසුවියන් | (D) ප්ලිනියන් |
| (2) | (A) හවායියන් | (B) විසුවියන් | (C) ප්ලිනියන් | (D) ස්ට්‍රොම්බෝලියන් |
| (3) | (A) ප්ලිනියන් | (B) හවායියන් | (C) ස්ට්‍රොම්බෝලියන් | (D) විසුවියන් |
| (4) | (A) ස්ට්‍රොම්බෝලියන් | (B) විසුවියන් | (C) ප්ලිනියන් | (D) හවායියන් |
| (5) | (A) ප්ලිනියන් | (B) විසුවියන් | (C) ස්ට්‍රොම්බෝලියන් | (D) හවායියන් |

(..............)

14. වෙරළක නිධිසාදිත ලක්ෂණ A, B, C සහ D ලෙස පහත රූපසටහනේ දැක්වේ.




ඒවා නිවැරදි ව හඳුනා ගනු ලබන්නේ කවර පිළිතුරෙහි ද?

| | | | | |
|---|---|---|---|---|
| (1) | (A) ටොම්බෝලෝ | (B) බාධක වැල්ල | (C) කොකු තුඩු | (D) වැලි තුඩු |
| (2) | (A) වැලි තුඩු | (B) ටොම්බෝලෝ | (C) බාධක වැල්ල | (D) කොකු තුඩු |
| (3) | (A) බාධක වැල්ල | (B) කොකු තුඩු | (C) වැලි තුඩු | (D) ටොම්බෝලෝ |
| (4) | (A) කොකු තුඩු | (B) වැලි තුඩු | (C) ටොම්බෝලෝ | (D) බාධක වැල්ල |
| (5) | (A) කොකු තුඩු | (B) බාධක වැල්ල | (C) ටොම්බෝලෝ | (D) වැලි තුඩු |

(..............)

Learning Resource Ce... R De Mazenod College Kandana

15. උත්තරාර්ධ ගෝලයේ වෙළඳ සුළං හමා යන්නේ,
(1) නිරිත දෙසිනි. ( $5^\circ - 30^\circ$ අතර)
(2) ඊසාන දෙසිනි. ( $5^\circ - 30^\circ$ අතර)
(3) නිරිත දෙසිනි. ( $10^\circ - 30^\circ$ අතර)
(4) ඊසාන දෙසිනි. ( $0^\circ - 30^\circ$ අතර)
(5) වයඹ දෙසිනි. ( $0^\circ - 30^\circ$ අතර)
(............)

16. එල් නිනෝ ප්‍රපංචය ඇති කිරීමට බලපාන සාධකය නිවැරදි ව දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙ ද?
(1) නැගෙනහිර පැසිපික් සාගරය උණුසුම් වීමෙන් අසාමාන්‍ය කාලගුණික රටාවක් නිර්මාණය වීම.
(2) පැසිපික් සාගරයෙහි කාලගුණ රටාවේ සිදුවන ඍතුමය වෙනස් වීම.
(3) අත්ලාන්තික් සාගරයේ අසාමාන්‍ය කාලගුණ රටාව
(4) පැසිපික් සාගරයේ කාලගුණ රටාවේ සිදුවන දෛනික වෙනස් වීම.
(5) අත්ලාන්තික් සාගරයේ කාලගුණ රටාවේ සිදුවන ඍතුමය වෙනස්වීම.
(............)

17. පහත සඳහන් වන්නේ කිසියම් ජාත්‍යන්තර / ප්‍රාදේශීය සංවිධානයක මෙහෙවර ප්‍රකාශයකි.
"අනාගත පරම්පරාවට හානි නොවන පරිදි පරිසරය සංරක්ෂණය කිරීම සඳහා ලෝකයේ ජාතීන් හා ප්‍රජාව දිරිමත් කිරීම ජීවගුණය වැඩි දියුණු කිරීම, නායකත්වය දීම හා සාමූහික සහභාගිත්වයෙන් කටයුතු කිරීමයි."
මෙය පහත සඳහන් කවර ජාත්‍යන්තර / ප්‍රාදේශීය සංවිධානයක මෙහෙවර ප්‍රකාශනයක් ද?
(1) ලෝක වනසත්ව අරමුදල (WWF) ය.
(2) ස්වභාව ධර්මය සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමයෙහි (IUCN) ය.
(3) අන්තර්ජාතික ජල කළමනාකරණ ආයතනයෙහි (IWMI) ය.
(4) එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනෙහි (UNEP) ය.
(5) දකුණු ආසියාතික සහයෝගිතා පාරිසරික වැඩසටහනෙහි (SACEP) ය.
(............)

18. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වාසුළි ඇතිවන කාල පරිච්ඡේදය වනුයේ
(1) මැයි සිට ජුනි දක්වා ය.
(2) මාර්තු සිට අප්‍රේල් දක්වා ය.
(3) ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා ය.
(4) දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ය.
(5) අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා ය.
(............)

19. සෑම වසරකම පෙබරවාරි 2 වැනිදා සමරනු ලබන්නේ,
(1) මිහිකත (මිහිමව) දිනයයි.
(2) ලෝක පරිසර දිනයයි.
(3) ලෝක තෙත්බිම් දිනයයි.
(4) ලෝක ජල දිනයයි.
(5) ඕසෝන් ස්ථරය සුරැකීම සඳහා වන අන්තර්ජාතික දිනයයි.
(............)

20. ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යානයක හා දැඩි ස්වභාවික රක්ෂිතයක නම් පිළිවෙළින් දැක්වෙනුයේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) ලුණුගම් වෙහෙර හා සේරුවිල
(2) නකල්ස් සහ මාදුරුඔය
(3) යාල සහ වැටහිර කන්ද
(4) මාදුරුඔය සහ රිටිගල
(5) නාකියාදෙනිය සහ හග්ගල
(............)

21. ජනසංක්‍රාන්ති න්‍යායට අනුව (A) ඉහළ උපත් අනුපාතිකයක් සහ (B) සීඝ්‍රයෙන් පහත වැටෙන මරණ අනුපාතිකයක් දැක්වෙන අවස්ථා නිවැරදි ලෙස හඳුනාගෙන ඇත්තේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
(1) (A) 1 වැනි අවස්ථාව (B) 2 වැනි අවස්ථාව
(2) (A) 2 වැනි අවස්ථාව (B) 3 වැනි අවස්ථාව
(3) (A) 2 වැනි අවස්ථාව (B) 4 වැනි අවස්ථාව
(4) (A) 3 වැනි අවස්ථාව (B) 4 වැනි අවස්ථාව
(5) (A) 1 වැනි අවස්ථාව (B) 3 වැනි අවස්ථාව
(............)

22. 2004 - 2009 කාලය තුළ දී, තෝරාගත් රටවල් හතරක දරිද්‍රතා මට්ටමින් පහළ ජීවත් වූ ජන පිරිස මුළු ජන සංඛ්‍යාවේ ප්‍රතිශත ලෙස පහත දැක්වේ.
(A) 21 (B) 35 (C) 45 (D) 70
මෙම දත්ත අදාල වන රටවල් නිවැරදිව සඳහන් කොට තිබෙන්නේ පහත දැක්වෙන පිළිතුරු අතුරින්, කවර පිළිතුරෙහි ද?
(1) (A) පකිස්ථානය, (B) නයිජීරියාව, (C) මාලදිවයින, (D) බංග්ලාදේශය
(2) (A) මාලදිවයින, (B) බංග්ලාදේශය, (C) පකිස්ථානය, (D) නයිජීරියාව
(3) (A) පකිස්ථානය, (B) මාලදිවයින, (C) නයිජීරියාව, (D) බංග්ලාදේශය
(4) (A) මාලදිවයින, (B) පකිස්ථානය, (C) බංග්ලාදේශය, (D) නයිජීරියාව
(5) (A) මාලදිවයින, (B) බංග්ලාදේශය, (C) නයිජීරියාව, (D) පකිස්ථානය
(............)

23. "1960 ගණන්වලදී ආහාර හිඟයකට මුහුණ දුන්නා වූ ප්‍රදේශය, විසර විසිපහක් ඇතුළත දී ජන සංඛ්‍යාවේ 70% ක වර්ධනයක් තිබියදී වුව ද, හරිත විප්ලවය හේතු කොට ගෙන ආහාර අතිරික්තයක් ලබා ගැනීමට සමත් විය."

පහත දැක්වෙන පිළිතුරු අතරින්, ඉහත විස්තරයට අදාළ වන ප්‍රදේශය, නිවැරදිව දක්වා ඇති පිළිතුර කවරේද?

(1) දකුණු ආසියාව (2) අග්නිදිග ආසියාව
(3) මෙක්සිකෝව හා දකුණු ඇමෙරිකාව (4) නැගෙනහිර ආසියාව
(5) අප්‍රිකාවේ සහෙල් ප්‍රදේශය (.............)

24. 'ලෝකයේ අධි තාක්ෂණික නිර්යාතවල වටිනාකමින් 50% ට වැඩි ප්‍රමාණයක්, ආර්ථිකයන් හතරක් මගින් සපයනු ලැබේ.'

පහත සඳහන් පිළිතුරු අතරින් එම ප්‍රධාන අපනයන ආර්ථිකයන් නිවැරදිව දැක්වෙනුයේ කවර පිළිතුරෙහි ද?

(1) ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, ඊශ්‍රායෙලය
(2) චීනය, යුරෝපා හවුල - 27, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය
(3) ජපානය, යුරෝපා හවුල - 27, චීනය, දකුණු කොරියාව
(4) චීනය, ප්‍රංශය, ජර්මනිය, දකුණු කොරියාව
(5) චීනය, ජපානය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය (.............)

25. 2010 වසරේ මානව සංවර්ධන වාර්තාවට අනුව, දකුණු ආසියාවේ තෝරා ගත් රටවල් පහක, උපතේ දී ජීවිතාපේක්ෂාව පහත දැක්වේ.

(A) 67.2 (B) 72.3 (C) 74.4 (D) 66.8 (E) 64.4

මෙම දත්ත අදාල වන රටවල් නිවැරදි ලෙස හඳුනාගෙන ඇත්තේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | (A) පකිස්ථානය | (B) මාලදිවයින | (C) ශ්‍රී ලංකාව | (D) භූතානය | (E) ඉන්දියාව |
| (2) | (A) ඉන්දියාව | (B) ශ්‍රී ලංකාව | (C) මාලදිවයින | (D) පකිස්ථානය | (E) භූතානය |
| (3) | (A) පකිස්ථානය | (B) ශ්‍රී ලංකාව | (C) ඉන්දියාව | (D) භූතානය | (E) මාලදිවයින |
| (4) | (A) ශ්‍රී ලංකාව | (B) පකිස්ථානය | (C) මාලදිවයින | (D) භූතානය | (E) ඉන්දියාව |
| (5) | (A) මාලදිවයින | (B) ශ්‍රී ලංකාව | (C) භූතානය | (D) ඉන්දියාව | (E) පකිස්ථානය |

(.............)

26. 2009 දී ශ්‍රී ලංකාවට සංචාරකයින් වැඩිම සංඛ්‍යාවක් පැමිණි රටවල් අවරෝහණ පිළිවෙළට නිවැරදිව දක්වා ඇත්තේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?

(1) ප්‍රංශය, ජර්මනිය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව
(2) ඉන්දියාව, එක්සත් රාජධානිය, ප්‍රංශය, ඉතාලිය
(3) එක්සත් රාජධානිය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, ජපානය
(4) ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව
(5) ජපානය, ඉන්දියාව, ජර්මනිය, තායිලන්තය (.............)

27. ශ්‍රී ලංකාවේ විශාලතම ඇපටයිට්, ෆෙල්ස්පා හා මිනිරන් නිධි පිහිටා ඇති පළාත් පිළිවෙළින් සඳහන් වන්නේ කවර පිළිතුරෙහි ද?

| | | | |
|---|---|---|---|
| (1) | (A) වයඹ | (B) බස්නාහිර | (C) මධ්‍යම |
| (2) | (A) මධ්‍යම | (B) සබරගමුව | (C) බස්නාහිර |
| (3) | (A) උතුරු මැද | (B) මධ්‍යම | (C) වයඹ |
| (4) | (A) සබරගමුව | (B) මධ්‍යම | (C) බස්නාහිර |
| (5) | (A) බස්නාහිර | (B) වයඹ | (C) මධ්‍යම |

(.............)

28. ජල සම්පාදනය කළ හැකි භූමියේ ප්‍රමාණයේ විශාලත්වය අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාර අවරෝහණ පිළිවෙළට දක්වා ඇත්තේ පහත කවර පිළිතුරෙහි ද?

(1) සේනානායක සමුද්‍රය, පරාක්‍රම සමුද්‍රය, යෝධ වැව
(2) උඩවලවේ, යෝධ වැව, සේනානායක සමුද්‍රය
(3) සේනානායක සමුද්‍රය, උඩවලවේ, රාජාංගනය
(4) උඩවලවේ, සේනානායක සමුද්‍රය, පදවිය
(5) සේනානායක සමුද්‍රය, උඩවලවේ, ලුණුගම්වෙහෙර (.............)

29. 2008 - 2009 ශ්‍රී ලංකාව සඳහා වූ 'සහස්‍ර සංවර්ධන ඉලක්ක' වාර්තාවට අනුව දිවයිනේ දරිද්‍රතාවේ ශීර්ෂ සංඛ්‍යා දර්ශකය (Poverty Head Index) 15.2 විය. එම දර්ශකය ට වඩා දෙගුණයක් වැඩි වූ දර්ශක පැවැති දිස්ත්‍රික්ක දෙක නිවැරදි ලෙස දක්වා ඇත්තේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?

(1) රත්නපුරය, පුත්තලම
(2) හම්බන්තොට, කෑගල්ල
(3) පොළොන්නරුව, බදුල්ල
(4) පුත්තලම, මොනරාගල
(5) නුවරඑළිය, මොනරාගල
(.............)

30. 2008, 2009, 2010 යන වර්ෂයන් හි ශ්‍රී ලංකාව ලැබූ සාමාන්‍ය වී අස්වැන්න නිවැරදි ව පිළිවෙලින් දැක්වෙනුයේ කවර පිළිතුරෙහි ද?

(1) හෙක්ටයාර 1 ට කිලෝග්‍රෑම් 2551, 2700, 3518
(2) හෙක්ටයාර 1 ට කිලෝග්‍රෑම් 3800, 3912, 3915
(3) හෙක්ටයාර 1 ට කිලෝග්‍රෑම් 4182, 4330, 4528
(4) හෙක්ටයාර 1 ට කිලෝග්‍රෑම් 4428, 4555, 5100
(5) හෙක්ටයාර 1 ට කිලෝග්‍රෑම් 5100, 5222, 5235
(.............)

✦✦✦

27 . 03 . 2018

ද මැසිනොද් විදුහල කඳාන

# De Mazenod College - Kandana

# භූගෝල විද්‍යාව -I

දෙවන වාර පරීක්ෂණය 2018 මාර්තු

13 ශ්‍රේණිය

Learning Resource Centre R De Mazenod College Kandana

## II කොටස

*උපදෙස්:*

* **පළමුවැනි** ප්‍රශ්නයටත්, **දෙක** හා **තුන** ප්‍රශ්නවලින් **එකක්** තෝරාගෙන **ප්‍රශ්න දෙකකට පමණක්** පිළිතුරු සපයන්න.
* 1 : 50,000 රත්නපුරය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් හා ප්‍රස්තාර කඩදාසියක් ඔබට සපයා ඇත.

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ රත්නපුරය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

* **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නො වේ.**
* **ප්‍රශ්න අංකය** සහ අදාළ **උපකොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
* සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නො වේ**.

(i) සිතියමෙහි **A** සහ **B** චතුරස්‍ර තුළ දැක්වෙන ජලවහන ලක්ෂණ **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) **CD** සහ **EF** රේඛාවලින් දක්වා ඇති බෑවුම් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) **G** චතුරස්‍රය තුළ දැක්වෙන නගරයෙහි පිහිටීමේ කැපීපෙනෙන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

(iv) සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ ව අදහස් දක්වන්න. (ලකුණු 04 යි)

(v) සිතියම් ප්‍රදේශයෙහි මාර්ග ජාලයේ ව්‍යාප්තිය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(vi) සිතියමෙහි වයඹදිග කාර්තුවෙහි දැක්වෙන ප්‍රදේශයේ භූවිෂමතාව සහ භූමි පරිහරණය අතර සම්බන්ධතාව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

**2.** (i) නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත (i) හි ඔබ නම් කරන ලද නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප **තුන** නිර්වචනය කරන්න. (ලකුණු 06 යි)

(iii) ඉහත (i) හි නම් කරන ලද **එක්** නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්පයක වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප භාවිතයේ දී ශ්‍රී ලංකාව මුහුණපාන සීමාකාරී තත්ත්ව **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** වර්ෂාපතන නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා වූ මාසික වර්ෂාපතන වටිනාකම් පහත **වගු අංක 1** මගින් දැක්වේ.

**නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක වාර්තා වූ මාසික වර්ෂාපතනය (mm)**

| මාසය | මධ්‍යස්ථාන | |
|---|---|---|
| | **A** | **B** |
| ජනවාරි | 65 | 44 |
| පෙබරවාරි | 76 | 93 |
| මාර්තු | 62 | 51 |
| අප්‍රේල් | 167 | 32 |
| මැයි | 215 | 105 |
| ජූනි | 165 | 151 |
| **එකතුව** | **750** | **476** |

**වගු අංක 1**

**වගු අංක 1** හි දැක්වෙන දත්ත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මධ්‍යස්ථාන දෙකෙහි වර්ෂාපතනයෙහි මධ්‍යන්‍යය අගයන් වෙන් වෙන්ව ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ii) මධ්‍යස්ථාන දෙක සඳහා ම මාසික මධ්‍යන්‍ය අපගමන අගයන් ගණනය කරන්න. (ලකුණු 04 යි)

(iii) **වගු අංක 01** දැක්වෙන දත්ත ද්විත්ව තීරු ප්‍රස්තාරයක් මගින් නිරූපණය කරන්න. (ලකුණු 08 යි)

(iv) මධ්‍යස්ථාන දෙකෙහි වර්ෂාපතනයෙහි කැපීපෙනෙන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

* * *